## 1961 අංක 31 දරන ආයුර්වේද පනත

### ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය සහතික

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් විසින් වෛද්‍ය සහතික නිකුත් කිරීමේ දී පිළිපැදිය යුතු කරුණු **1972.02.03** දිනැති අංක **2 - 138/1**දරන ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර එම රීති බලාත්මක බව මෙයින් දැනුම් දෙමි. වෛද්‍ය සහතික නිකුත් කිරිමේ දී සිදුවන හෝ සිදුවිය හැකි අවධිමත් කටයුතු හා අක්‍රමිකතා අවම කිරීමටත්, ව්‍යාජ හා වංචනික ලෙස වෛද්‍ය සහතික නිකුත් කිරිම වැළැක්වීමෙන් ආයුර්වේද වෛද්‍ය වෘත්තියේ ගෞරවය ආරක්ෂා කිරීම සඳහාත්, එම ගැසට් නිවේදනයට අදාළව පහත සඳහන් කරුණු වෛද්‍යවරුන් ගේ අවධානයට යොමු විය යුතුය.

**1.** සෑම වෛද්‍ය සහතිකයකම රෝගියාගේ අංකය, නම, ලිපිනය, රෝග විනිශ්චය, ප්‍රතිකාර ලබා ගැනීම ආරම්භ කළ දිනය, වෛද්‍ය නිවාඩු අනුමත කරන දින ගණන, වෛද්‍ය සහතිකය නිකුත් කරන දිනය, රෝගියාගේ අත්සන, වෛද්‍යවරයාගේ අත්සන, නම, ලියාපදිංචි අංකය, ලියාපදිංචි අංශය යන කරුණු අනිවාර්යෙන්ම පැහැදිලිව හා නිවැරදිව ඇතුළත් විය යුතුය.

**2.** එසේම වෛද්‍ය සහතිකය නිකුත් කරනු ලබන්නේ කිසියම් අධිකරණ කටයුත්තක් සඳහා ද යන වග විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

**3.** සෑම වෛද්‍ය සහතිකයක්ම පිරවිය යුත්තේ වෛද්‍යවරයාගේ පැහැදිලි අත් අකුරින්ය. එබඳු අවස්ථාවක නොපැහැදිලි හෝ අවධිමත් හෝ නොසැලකිලිමත් ලෙස හෝ සාවද්‍ය ලෙස පිරවීම නොකළ යුතුය.

**4.** ඉහත කරුණු ඇතුළත් කොට වෛද්‍ය සහතික ආකෘතියක් මුද්‍රණය කර ගත හැකි අතර එහිදී වෛද්‍යවරයා ළඟ එහි පිටපතක් තබා ගත හැකි ලෙස හෝ පිළිපතක් **(counterfoil)** ඉතිරිවන ලෙස නිකුත් කිරිමට හැකි වන පරිදි එම පොත් සකස් කළ යුතුය.

**5.** සෑම විටෙකම සහතිකය නිකුත් කිරිමෙන් පසුව ඉතිරි වන පිළිපත **(counterfoil)** මත රෝගී අංකය, රෝග විනිශ්චය හා රෝගියාගේ අත්සන විශේෂයෙන්ම තබා ගත යුතුය.

**6.** තමා විසින් නිකුත් කළ සියළුම වෛද්‍ය සහතික වලට අදාළ පිළිපත් **(counterfoil)** සහිත කොටපොත අවශ්‍ය අවස්ථාවක දී ඉදිරිපත් කිරිම සඳහා ප්‍රවේශම් කොට තබා ගත යුතුය.

**7.** තමා වෙත පැමිණෙන යම් සේවාලාභියෙකු යම් රෝගයකින් පෙලෙන බව සනාථ වීමෙන් තොරව කිසිදු වෛද්‍ය සහතිකයක් නිකුත් නොකළ යුතුය.

**8.** රෝගියාගේ ඉල්ලීම පිට මිස වෙනත් මොනයම් ආකාරයකින් හෝ වෛද්‍ය සහතිකයක් නිකුත් කිරිමෙන් වැළකී සිටිය යුතුය.

**9.** තමාගෙන් ප්‍රතිකාර ලබාගත් කාල සීමාවට පමණක් මිස විශේෂයෙන්ම තමා ළඟට පැමිණීමට පෙර කාලය සඳහා වෛද්‍ය සහතික නිකුත් කිරිමෙන් වැළකිය යුතුය.

**10.** විශේෂ වෛද්‍යවරුන් තමා ලියාපදිංචිය ලත් අංශයට හැර වෙනත් අංශයක් සම්බන්ධයෙන් වෛද්‍ය සහතික නිකුත් කිරිම නොකළ යුතුය.

**11.** එම රෝගයට අදාළ රෝග විනිශ්වය හැර වෙනත් රෝග විනිශ්වයක් හෝ රෝගී තත්වයක් රෝග විනිශ්වය ලෙස සඳහන් නොකළ යුතුය.

**12.** යම් තැනැත්තෙකු හට වෛද්‍ය සහතිකයක් නිකුත් කරන සෑම අවස්ථාවකම රෝගී නාම ලේඛනයේ සඳහන් රෝගී අංකය එම වෛද්‍ය සහතිකයේ සඳහන් කළ යුතුය. එසේම එබඳු සෑම අවස්ථාවකම වෛද්‍ය සහතිකයක් නිකුත් කළ බව රෝගී නාම ලේඛනයේ සටහන් කළ යුතුය.

**13.** මෙම රෝගී නාම ලේඛනය හා පිළිපත් **(counterfoil)** සහිත කොට පොත අවශ්‍ය අවස්ථාවක දී පරීක්ෂා කිරිමට හෝ එසේ පරීක්ෂා කිරිම සඳහා ඉදිරිපත් කරන ලෙස නියෝග කිරිමට ආයුර්වේද වෛද්‍ය සභාවට බලය තිබේ.

**14.** එසේම මෙම රීති වලට පටහැනිව යම් වෛද්‍යවරයෙකු වෛද්‍ය සහතික නිකුත් කරන්නේ නම් එය **1972** අංක දරන ගැසට් නිවේදනය අනුව වෘත්තීය විෂමාචාරයක් වන අතර ඒ සම්බන්ධයෙන් **1972** විනය නියෝග යටතේ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට ආයුර්වේද වෛද්‍ය සභාවට බලය තිබේ.

විශේෂ : කිසියම් ආයතනයකට යම් වෛද්‍ය සහතිකයක් සම්බන්ධයෙන් පරීක්ෂා කිරිමට අවශ්‍ය බව හැඟී යන්නේ නම් ඒ බව ආයුර්වේද වෛද්‍ය සභාවට දැන්විය යුතුය. එහිදී ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය නොලැබූ යම් තැනැත්තෙකු තමන් ලියාපදිංචි වෛද්‍යවරයෙකු බව හඟවමින් ව්‍යාජ හා වංචනික ලෙස වෛද්‍ය සහතික නිකුත් කරන්නේ නම් ඊට එරෙහිව දැඩි පියවර ගනු ලැබේ.

වෛද්‍ය සහතික පොත් අවශ්‍ය වෛද්‍යවරුන් හට ඒවා ආයුර්වේද වෛද්‍ය සභාවෙන් ලබා ගැනීමට හැකිය.

මෙම කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කිරිම ඔබ මෙන්ම අප හට ද පහසුවක් වන අතරම ආයුර්වේද ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය ද ආරක්ෂා කිරිමට හේතු වනු ඇත. මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර ලබා ගැනීමට කැමති යම් තැනැත්තෙකු හට ආයුර්වේද වෛද්‍ය සභාවෙන් විමසිය හැකිය.

අ/කලේ:පී.එස්.කේ.ආර්.වීරකෝන්
ආයුර්වේද කොමසාරිස් සහ
ආයුර්වේද වෛද්‍ය සභාවේ සභාපති

වෛද්‍ය එච්.බැසිල් රංජිත් ප්‍රනාන්දු
ලේඛකාධිකාරී,
ආයුර්වේද වෛද්‍ය සභාව

**ආ.වෛ.ස/මාර්ගෝපදේශ/03**

දුරකථන අංක : **011-2746754** **011 -5672905** **011 -5672906**